කෘෂිකර්ම හා වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය
පොල් සංවර්ධන අධිකාරිය

පොල් සංවර්ධන අධිකාරියේ දැනට පුරප්පාඩුව පවත්නා පහත සඳහන් තනතුරු සඳහා සුදුසුකම් හා පළපුරුද්ද ලත් ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් අයදුම්පත් මෙයින් කැඳවනු ලැබේ.

1. **තනතුර -වැඩසටහන් සහකාර (සැකසුම් සංවර්ධන)**

**තනතුරු සංඛ්‍යාව 02**

**සේවා ගණය :** ආශ්‍රිත නිලධාරි සේවා ගණය (MA 3))

**වැටුප් ක්‍රමය :** රු.32,200/-, 10x445/=රු.11x660/-, 10x730/-, 5x750/- 54960/- (MA 3- 2016) ( මාසික )+රජයේ අනුමත දීමනා

**ආරම්භක වැටුප් පියවර : රු.32,200/-**

**අධ්‍යාපන සුදුසුකම් හා පළපුරුද්ද :**

විශ්වවිද්‍යාල කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් රසායන විද්‍යාව, ශුද්ධ, ව්‍යවහාරික විද්‍යාව හෝ කෘෂි විද්‍යාව පිළිබඳ උපාධියක් ලබා තිබීම.

**වයස :** අයදුම්පත් බාර ගන්නා දිනට අවුරුදු 22 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. රජයේ දෙපාර්තමේන්තු, පළාත් රාජ්‍ය සේවය, රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත මණ්ඩලවල දැනට සේවයේ නියුතු අයදුම්කරුවන්ට හා පොල් සංවර්ධන අධිකාරියේ ස්ථිර සේවයේ නියුතු අයදුම්කරුවන්ට මෙම උපරිම වයස් සීමාව බලපානු නොලැබේ.

**බඳවා ගැනීමේ ක්‍රමවේදය :** ලිඛිත තරඟ විභාගය හා/හෝ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මඟින්

2. **තනතුර -වැඩසටහන් සහකාර (තාක්ෂණික සේවා)**

**තනතුරු සංඛ්‍යාව 15**

**සේවා ගණය :** ආශ්‍රිත නිලධාරි සේවා ගණය (MA 3))

රාජකාරි ස්වභාවය : පොල් හා පොල් කර්මාන්ත ක්ෂේත්‍රය සංවර්ධනය උදෙසා පූර්ණ කාලීනව ක්ෂේත්‍ර රාජකාරිවල යෙදිය යුතු වේ.

**වැටුප් ක්‍රමය-** රු.32,200/-,10x445/=රු.11x660/-, 10x730/-, 5x750/- 54960/- (MA 3- 2016) ( මාසික )+රජයේ අනුමත දීමනා

**ආරම්භක වැටුප් පියවර :** රු.32,200/-

**අධ්‍යාපන සුදුසුකම් හා පළපුරුද්ද**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් විද්‍යාවේදී, කෘෂි විද්‍යාවේදී, ඉංජිනේරු උපාධියක් ලබා තිබීම.

**වයස :** අයදුම්පත් බාර ගන්නා දිනට අවුරුදු 22 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. රජයේ දෙපාර්තමේන්තු, පළාත් රාජ්‍ය සේවය, රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත

මණ්ඩලවල දැනට සේවයේ නියුතු අයදුම්කරුවන්ට හා පොල් සංවර්ධන අධිකාරියේ ස්ථිර සේවයේ නියුතු අයදුම්කරුවන්ට මෙම උපරිම වයස් සීමාව බලපානු නොලැබේ.

**බඳවා ගැනීමේ ක්‍රමවේදය - ලිඛිත තරඟ විභාගය හා/ හෝ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මඟින්**

## 3. තනතුර -වැඩසටහන් සහකාර (තත්ත්ව පාලන)

**තනතුරු සංඛ්‍යාව 05**

**සේවා ගණය :** ආශ්‍රිත නිලධාරි සේවා ගණය (MA 3))

**වැටුප් ක්‍රමය-** රු.32,200,/=10x445/=රු.11x660/-, 10x730/-, 5x750/- 54960/- (MA 3- 2016) (මාසික )+රජයේ අනුමත දීමනා

**ආරම්භක වැටුප් පියවර :** රු.32,200/-

**අධ්‍යාපන සුදුසුකම් හා පළපුරුද්ද :**

විශ්වවිද්‍යාල කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් රසායන විද්‍යාව, ක්ෂුද්‍ර ජීව විද්‍යාව, ජෛව රසායන විද්‍යාව, උද්භිද විද්‍යාව පිළිබඳ උපාධියක් ලබා තිබීම.

**වයස** - අයදුම්පත් බාර ගන්නා දිනට අවුරුදු 22 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. රජයේ දෙපාර්තමේන්තු, පළාත් රාජ්‍ය සේවය, රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත මණ්ඩලවල දැනට සේවයේ නියුතු අයදුම්කරුවන්ට හා පොල් සංවර්ධන අධිකාරියේ ස්ථිර සේවයේ නියුතු අයදුම්කරුවන්ට මෙම උපරිම වයස් සීමාව බලපානු නොලැබේ.

**බඳවා ගැනීමේ ක්‍රමවේදය : ලිඛිත තරඟ විභාගය හා/ හෝ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මඟින්**

## 4. තනතුර : වැඩසටහන් සහකාර (අලෙවි පර්යේෂණ)

**තනතුරු සංඛ්‍යාව : 02**

**සේවා ගණය :** ආශ්‍රිත නිලධාරි සේවා ගණය (MA 3))

**වැටුප් ක්‍රමය:** රු.32,200,/=10x445/=රු.11x660/-, 10x730/-, 5x750/- 54960/-(MA 3- 2016) ( මාසික )+රජයේ අනුමත දීමනා

**ආරම්භක වැටුප් පියවර :** රු.32,200/-

**අධ්‍යාපන සුදුසුකම් හා පළපුරුද්ද :**

විශ්වවිද්‍යාල කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් අලෙවිකරණය, වාණිජවේදී, කළමනාකරණ, ව්‍යාපාර පරිපාලන, ආර්ථික විද්‍යාව, පිළිබඳ උපාධියක් ලබා තිබීම.

**වයස : අයදුම්පත් බාර ගන්නා** දිනට අවුරුදු 22 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. රජයේ දෙපාර්තමේන්තු, පළාත් රාජ්‍ය සේවය, රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත මණ්ඩලවල දැනට සේවයේ නියුතු අයදුම්කරුවන්ට හා පොල් සංවර්ධන අධිකාරියේ ස්ථිර සේවයේ නියුතු අයදුම්කරුවන්ට මෙම උපරිම වයස් සීමාව බලපානු නොලැබේ.

**බඳවා ගැනීමේ ක්‍රමවේදය: ලිඛිත තරඟ විභාගය හා/ හෝ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මඟින්**

5. තනතුර : රසායනාගාර ක්ෂේත්‍ර සහකාර

තනතුරු සංඛ්‍යාව - 01

සේවා ගණය - කළමනාකරණ සහකාර (තාක්ෂණ නොවන) (MA 1-1)

වැටුප් ක්‍රමය: රු.27,910/-,10x300/-,7x350/-,4x495/-,20x660/-= රු.48,540/-
(MA 1-1-2016 )(මාසික)+රජයේ අනුමත දීමනා

ආරම්භක වැටුප් පියවර : රු.27,910/-,

**සුදුසුකම්(බාහිර) :**

1. අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයෙන් සිංහල භාෂාව/දෙමළ භාෂාව, ගණිතය, ඉංග්‍රීසි, විද්‍යාව යන විෂයයන් හතරට සම්මාන සාමාර්ථයන් සහිතව එකවර විෂයයන් හයකින් (06) සමත්ව තිබීම

සමඟ

2. අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේදී විද්‍යා විෂය ධාරාවෙන් (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) විෂයයන් තුනකින් එකවර සමත්ව තිබීම

රජයේ හෝ පෞද්ගලික ආයතනයක රසායනාගාර ක්ෂේත්‍රයේ පළපුරුද්දක් ලබා තිබීම අමතර සුදුසුකමක් ලෙස සැලකේ.

**සුදුසුකම් (අභ්‍යන්තර) :**

ප්‍රාථමික ශ්‍රේණිය අර්ධ ශිල්පීය සේවා ගණයෙහි පහත 1 සිට 3 දක්වා සඳහන් සුදුසුකම් ඇති රසායනාගාර සහායක තනතුරුවල සේවයේ නියුතු සේවකයින්ට මේ සඳහා අයදුම් කළ හැක.

1. අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයෙන් සිංහල භාෂාව/දෙමළ භාෂාව, ගණිතය, ඉංග්‍රීසි, විද්‍යාව යන විෂයයන් හතරට සම්මාන සාමාර්ථයන් සහිතව එකවර විෂයයන් හයකින් (06) සමත්ව තිබීම.

සහ

2. සේවයේ ස්ථිර පත්වීම් දැරීම හා එම පත්වීම්වල ස්ථිර කර තිබීම

සහ

3. නියමිත දිනට පූර්වාසන්න ස්ථිර පත්වීමක යටත් පිරිසෙයින් අවුරුදු 05 ක අඛණ්ඩ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කොට තිබීම.

**වයස:** අයදුම්පත් බාරගන්නා දිනට අවුරුදු 18 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. රජයේ දෙපාර්තමේන්තු, පළාත් රාජ්‍ය සේවය, රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත මණ්ඩලවල දැනට සේවයේ නියුතු අයදුම්කරුවන්ට හා පොල් සංවර්ධන අධිකාරියේ ස්ථිර සේවයේ නියුතු අයදුම්කරුවන්ට මෙම උපරිම වයස් සීමාව බලපානු නොලැබේ.

**බඳවා ගැනීමේ ක්‍රමය:** තරඟ විභාගයක් හා/හෝ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින්

ප්‍රතිලාභ :

1. 1983 අංක 12 දරණ පාරිතෝෂික පනත යටතේ පාරිතෝෂික දීමනා.
2. සේවක වෛද්‍ය රක්ෂණය හා පුද්ගල හදිසි අනතුරු රක්ෂණාවරණය/ කම්කරු වන්දි රක්ෂණය
3. සේවක අර්ථසාධක අරමුදල: සේවකයා 10% සේව්‍යයා 15% සේවා නියුක්තයන්ගේ භාරකාර අරමුදල සේව්‍යයා 3%
4. අධිකාරියේ සේවකයින්ට දෙනු ලබන අනෙකුත් ප්‍රතිලාභ

වෙනත් :

ඉහත තනතුරු සඳහා

i. ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.
ii. තනතුරට පැවරෙන කාර්යයන් මැනවින් ඉටු කිරීම සඳහා මෙන්ම දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම සඳහා අවශ්‍ය වන කායික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.
iii. විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතුය.

අයදුම්කරුවන්ගේ වර්තමාන රැකියාව, වැටුප් විස්තර, කලින් දරණ ලද තනතුරු, සේවය කරන ලද කාල සීමාව, සමඟ අයදුම්කරු පිළිබඳ තොරතුරු ලබා ගතහැකි ඥාති සම්බන්ධතාවයක් නොමැති පුද්ගලයන් දෙදෙනෙකුගේ නම් සහ ලිපිනයන් ඇතුළත්ව අයදුම්කරුගේ සම්පූර්ණ විස්තර සහිතව පිළියෙල කරන ලද අයදුම්පත උප්පැන්න සහතිකය, අධ්‍යාපන, වෘත්තීය සුදුසුකම් සහ පළපුරුද්ද පිළිබඳ සහතිකවල පිටපත් ද සමඟ ලියාපදිංචි තැපෑලෙන් පහත සඳහන් ලිපිනයට 2024.05.02 දින හෝ ඊට පෙර එවිය යුතුය. අයදුම්පත් බහා එවනු ලබන කවරයේ වම්පස ඉහළ කෙළවරේ අදාළ තනතුර සඳහන් කළ යුතුය.

රජයේ දෙපාර්තමේන්තු/පළාත් රාජ්‍ය සේවය/රාජ්‍ය සංස්ථා/ව්‍යවස්ථාපිත මණ්ඩලවල දැනට සේවයේ නියුතු අයදුම්කරුවන් සිය අයදුම්පත් ආයතන ප්‍රධානී මඟින් ද පොල් සංවර්ධන අධිකාරියේ ස්ථිර සේවයේ නියුතු අයදුම්කරුවන් සිය අයදුම්පත් අංශ ප්‍රධානීන් මඟින්ද එවිය යුතුය.

අයදුම්පත් එවිය යුතු අවසාන දිනට පසුව ලැබෙන අයදුම්පත්, ඉහත සඳහන් සුදුසුකම් සහ සහතික පත් නොමැති හා දෙපාර්තමේන්තු /ආයතන ප්‍රධානීන් මඟින් යොමු කරනු නොලබන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

මෙම දැන්වීම පොල් සංවර්ධන අධිකාරියේ වෙබ් අඩවියෙහිද පළ කර ඇත. www.cda.gov.lk

සභාපති
පොල් සංවර්ධන අධිකාරිය
අංක 54, නාවල පාර,
නාරාහේන්පිට,
කොළඹ 05.